අධිකරණ අමාත්‍යාංශය நீதி அமைச்சு MINISTRY OF JUSTICE

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය
தேசிய ஒற்றுமை மற்றும் நல்லிணக்கத்திற்கான அலுவலகம்
Office For National Unity And Reconciliation

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රියදුරු — තනතුරු සංඛ්‍යාව : 03

සේවා ගණය : **PL 3**

තනතුරෙහි ස්වභාවය

- පවරනු ලබන ආයතනික වාහන, පරීක්ෂාකාරීව සහ සැලකිලිමත්ව පැදවීම හා එහි වගකීම දැරීම
- වාහන නිසි කලට සේවා/ අළුත්වැඩියා කර ගැනීම
- වාහනවල සිදුවන සුලු දෝෂ නිවැරදි කර ගැනීම හා අවශ්‍ය නඩත්තු කටයුතු ඉටු කරවා ගැනීම
- පවරනු ලබන වාහනයේ සවි කිරීම් උපාංග හා අමතර කොටස් පිළිබඳව හා ඒවායේ ආරක්ෂාව පිළිබඳව වගකීම් දැරීම
- වාහන ධාවන සටහන් නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාම සහ දෛනිකව ඒවා වාහන භාර නිලධාරී වෙත ඉදිරිපත් කර පරීක්ෂා කරවා ගැනීම
- වාහන පැදවීමේදී සිදුවන හදිසි අනතුරු සම්බන්ධව වහාම අවශ්‍ය කටයුතු කිරීම
- අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරයකු/නිලධාරීන් විසින් ආයතනික සේවා අවශ්‍යතාව අනුව පවරනු ලබන අනෙකුත් විවිධ කාර්යයන් ඉටු කිරීම.

සුදුසුකම් (පහත 1 හෝ 2)

1.අධ්‍යාපන සුදුසුකම් **:**

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

2.ප්‍රවීණතා **:**

- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

වයස් සීමාව

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය

PL 3 - 2025 - රු. (43,280 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - 67,040)

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED